# 1815 උඩරට ගිවිසුම සහ මහා විහාරය

විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය

# 1815 KANDYAN CONVENTION AND MAHĀVIHĀRA

(A Refereed Journal)

ප්‍රකාශනය

මල්වතු මහාවිහාරය

# 1815 උඩරට ගිවිසුම සහ මහා විහාරය

## විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය


**සංස්කාරක මණ්ඩලය**

මහවෙල රතනපාල හිමි
*Royal Pandit (O.S.S.S), B.A. (Hons), M.Phil. (Cand.)*

ලාහුගල සුගතඤාණ හිමි
*Royal Pandit (O.S.S.S), B.A. (Hons), M.A., M.Phil., Dip in Ed.*

වෙලගෙදර සුමනජෝති හිමි
*Royal Pandit (O.S.S.S), B.A. (Hons), M.Phil. (Cand.)*

වැම්පිටියේ ඉඥවිමල හිමි
*Royal Pandit (O.S.S.S), B.A. (Hons), M.A, M.Phil. (Cand.)*

වත්තේගෙදර ධම්මානන්ද හිමි
*B.A. (Hons), M.A.*

වරාගම ඤාණරතන හිමි
*Royal Pandit (O.S.S.S) B.Ed. (Cand.)*

අජිත් තල්වත්ත
*B.A. (Hons), M.A.( PDN), M. Phil, Ph.D. (KLN)*

පී. එල්. ලලිත් අබේසේකර
*Royal Pandit (O.S.S.S) B.A., M.A., Dip in Ed.*



මල්වතු මහාවිහාරය

මහනුවර

2562
2019

මෙහි අන්තර්ගත ලිපිවල අයිතිය ඒ ඒ ලේඛකයන් සතු ය. අක්ෂර වින්‍යාසය, පද බෙදීම හා මූලාශ්‍රය දැක්වීම සංස්කාරකවරුන් විසින් සකස් කරන ලදි. සංස්කාරකවරුන්ගේ අදහස් ලිපි අන්තර්ගතයෙන් පිළිබිඹු නොවන බව සැලකුව මනා ය.

# 1815 උඩරට ගිවිසුම සහ මහාවිහාරය

විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය

මහවෙල රතනපාල හිමි
ලාහුගල සුගතඤාණ හිමි
අජිත් තල්වත්ත
වෙලගෙදර සුමනජෝති හිමි
ටැම්පිටියේ ඉඳුවිමල හිමි
වත්තේගෙදර ධම්මානන්ද හිමි
වරාගම ඤාණරතන හිමි
පී. එල්. ලලිත් අබේසේකර

ප්‍රථම මුද්‍රණය : 2019

ISBN : 978-624-5052-00-4

පරිගණක පිටු සැකසුම : බොරලන්දේ ධම්මරතන හිමි
පහළමීගොල්ලේ ලංකානන්ද හිමි

මුද්‍රණය : ක්‍රියේටිව් ප්‍රින්ටර්ස් ඇන්ඩ් ඩිසයිනර්ස්,
අංක 159/6 බී, ජයන්ති පාර, උඩුමුල්ල,
හල්ඔළුව.
දූරකථනය - 0815 702400
ෆැක්ස් - 0812 205722
e-mail : creativekandyas@gmail.com

ප්‍රකාශනය : මල්වතු මහාවිහාරය
මහනුවර

17. සුමේධ වීරවර්ධන,
*BA (Hons) MPhil, PhD (Reading) (PDN)*
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දර්ශන අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

18. පූජ්‍ය ගල්කුලමේ උපරතන හිමි
*BA (Hons) (RUSL), MA (KLN), MPhil (PDN), PGDE (RUSL)*
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා සහ මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.

19. නන්දන මිල්ලගල
*BA(Hons), MPhil (KLN)*
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා සහ මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

20. එම්. ජ්. ප්‍රසාද් කුමාර
*BA (Hons) (SJP), MPhil (Cand.) (KLN)*
කථිකාචාර්ය, මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

21. දමිත් රණගල
*BA (Hons) (SJP) MPhil (Cand.)*
කථිකාචාර්ය, ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

22. පර්ල් කරල්ලියද්ද
*LLB (CMB)*
විශ්‍රාමලත් දිසාවිනිසුරු, (විශේෂ ශ්‍රේණිය)
සභාපති, වීර කැප්පෙටිපොල මොණරවිල ගුණානුස්මරණ පදනම.

23. **Prasantha Lal De Alwis**
*LLB, LLM, (CMB), President's Counsel*
Former state counsel of the Attorney Generals' Department. Visiting Lecturer, Faculty of Law, University of Colombo, Kotalawala Defense University (KDU).

24. සමන්ත රත්වත්ත
*LLB, LLM, (CMB)*
Attorney-at-Law, President's Counsel.

18. **දේශීය අස්පර්ශිත සංස්කෘතික උරුමය කෙරෙහි 1815 උඩරට ගිවිසුම ඇති කළ බලපෑම** **360**
Impact of 1815 Kandyan Convention on
Local Intangible Cultural Heritage
සී. එම්. තරිඳු බණ්ඩාර

19. **ක්‍රි. ව. 1815 උඩරට ගිවිසුමෙන් පසු ලාංකේය අධ්‍යාපනයට සිදු වූ බලපෑම** **370**
Impact of 1815 Kandyan Convention on Sri Lankan Education
ආචාර්ය සෙනවිරත්න බණ්ඩාර

20. **1815 උඩරට ගිවිසුමෙන් පසු ඌව වෙල්ලස්සේ භික්ෂු ක්‍රියාකාරිත්වය පිළිබඳ විමසුමක්** **382**
An Enquiry into Activities of Buddhist Monks in
Uva Wellassa Province After 1815 Kandyan Convention
ඩබ්ලිව්. එම්. මේනක රුවන් කුමාර

21. **උඩරට ගිවිසුම මගින් දේශීය ආර්ථිකයට සිදු වූ බලපෑම** **422**
Impact of Kandyan convention on Local Economy
මහාචාර්ය චන්දන රෝහණ විතානාච්චි

---

## 1815 උඩරට ගිවිසුම හා ස්වදේශීය ප්‍රතිරෝධතා

(1815 Kandyan Convention and Native Resistance)

---

22. **1815 උඩරට ගිවිසුම හා 1818 බ්‍රිතාන්‍ය විරෝධී සටන** **442**
1815 Kandyan Convention and Uprising of 1818
මහාචාර්ය කේ. එම්. පී. කුලසේකර

23. **මුරිසි දිවයිනට පිටුවහල් කෙරුණු 1818 නිදහස් සටන් නායකයන්** **458**
Leaders of 1818 Freedom Struggle Exiled to Mauritius
දමිත් රණගල

24. **1815 උඩරට යටත් වීම හා 1818 නිදහස් අරගලය කෙරෙහි රදලවරුන්ගේ කාර්යභාරය** **474**
Subjugation of Kandyan Kingdom and
Role of Aristocrats in 1818 Freedom Struggle
කාන්ති ජයසිංහ

# Leaders of 1818 Freedom Struggle Exiled to Mauritius

**Damith Ranagala**

## Abstract

Destiny of Sinhalese leaders and Buddhist monks dedicated their life to free the country from British colonialism was sort out in four ways. Property of some aristrocrats were escheated branding them as treasonists, many were imprisoned, some were beheaded and some were exiled from the country. In terms with British records, at first, group of 24 prisoners were exiled to Mauritius on 24th of February 1819. Later on Ehelepola Nilame imprionsed nearly 7 years without any charge exiled to Mauritius in 1825. As depicted in historical records some of the prisoners died in Mauritius and some freed from punishments returned Sri Lanka in 1832. This article aims at making an examination on destiny of the leaders of 1818 freedom struggle exiled to Mauritius under the charge of treason.

# මුරිසි දිවයිනට පිටුවහල් කෙරුණු 1818 නිදහස් සටන් නායකයන්

දමිත් රණගල

## හැඳින්වීම

ක්‍රි.ව. 1803 දී අවිබලයෙන් යටත් කරගැනීමට අසමත් වූ උඩරට රාජ්‍යය, ඉන් වසර 12කට පසු උඩරැටියන් විසින් ම ඉංග්‍රීසින්ට පැවරීම දෛවෝපගත සිදුවීමකි.[1] ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ මර්දනකාරී පාලනයෙන් මිදීම එලෙස ඉංග්‍රීසින් කැඳවා ගැනීමේ අභිලාෂය වුව ද එහි දී ඔවුන් උඩරට පැළපදියම් වනු ඇතැයි උඩරැටියෝ කිසිවිටකත් නොසිතූහ.[2] එහෙත් 1815 පෙබරවාරි 18වන දින මැදමහනුවර සිට සැතපුමක් එපිටින් වූ ගල්ලැහැවත්ත පිහිටි උඩුපිටිය ආරච්චිගේ නිවසේ දී රජු අත්අඩංගුවට ගත් ඉංග්‍රීසීහු ලහි ලහියේ සකස් කළ ගිවිසුමක් මගින් උඩරට රාජ්‍යයේ බලය සියතට ගත්හ.[3] 1815 දී ඉංග්‍රීසින්ට මෙරට නතු කර දුන් වගන්ති දොළොසකින් සමන්විත එම ගිවිසුම මගින් මුල්වරට මුළු ලංකාද්වීපය ම පරහස්ත ගත විය.[4]

---

[1] ජෝන් ඩොයිලිගේ වචනයෙන් ම ප්‍රකාශ කළ හොත් කුඩැල්ලකුගෙන් තරමටවත් හිංසාවක් ඉංග්‍රීසි හමුදාවන්ට මේ අවස්ථාවේ දී උඩරැටියන් ගෙන් සිදු නොවී ය.

[2] "නුඹලා විසින් රජු බලයෙන් පහ කොට අවසන් ය. නුඹලාට කිරීමට තවත් කිසිවක් මෙහි නැත. ඒ නිසා දැන් නුඹලාට පිට වී යා හැකි ය" යැයි උඩරට වැසියෙක් කළ ප්‍රකාශයක් පිළිබඳ හෙන්රි මාෂල් කර ඇති සඳහනින් පැහැදිලි වන්නේ ඉංග්‍රීසින් ලවා කෲර ක්‍රියා කළ රජු සිංහාසනයෙන් නෙරපා දැමීම හැර වෙනත් කිසිඳු අභිලාෂයක් උඩරැටියන් තුළ නොවූ බව ය; Henry Marshall, *Ceylon*: A General Dedcription of the Island and its Inhabitants. Repr. (Kandy: 1954), 134.

[3] කොල්වින් ආර් ද සිල්වා, බ්‍රිතාන්‍යයින් යටතේ පැවති ලංකාව (1795-1833), (කොළඹ: ඇපොතිකරීස් සමාගමේ මුද්‍රණය, 1958), 174.

[4] නුවරඑළියේ හේමපාල, උඩරට ගිවිසුම, (මුල්ලේරියාව: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 2004), 19-39.

---

1815 උඩරට ගිවිසුම සහ මහාවිහාරය, සංස්. මහවෙල රතනපාල හිමි, ලාහුගල සුගතඤාණ හිමි, අජිත් තල්වත්ත ආදීහු, මහනුවර: මල්වතු මහාවිහාරය, 2019.

මෙම ගිවිසුම වූ කලී ඇහැලේපොල මහනිලමේගේ බලාපොරොත්තු මහත් සේ කඩවීමකි.[5] ඇහැලේපොල රජ වනු දැකීමට බොහෝ රදලයන්ගේ මනාපයක් නොතිබුණ ද ශ්‍රී වික්‍රම රාජසිංහ වෙනුවට වෙනත් රාජවංශිකයකු උඩරට සිහසුනට පත්වනු දැකීම ඔවුන්ගේ අපේක්ෂාව විය. තමන්ගේ දුක්ගැනවිලි ඉදිරිපත් කළ හැකි දෘශ්‍යමාන බෞද්ධ රජ කෙනකු වෙනුවට මුහුදින් එතෙර, කිසිදා නොදුටු අබෞද්ධ රජෙකුගේ සේවකයන් පිරිසකගේ නියෝගයන්ට නතු වීමට උඩරට සෑම පන්තියකට ම මේ තත්ත්වය තුළ සිදු විය. රදලයන්ගේ මහේශාක්‍ය බව ද, වරප්‍රසාද සහ තාන්න මාන්න ද ඉංග්‍රීසින්ගේ පාලනය යටතේ හැල්ලු වී ගියේ ය. පහළ පෙළේ ඉංග්‍රීසි සොල්දාදුවන් පවා තමන්ට ගරු සරුවක් නොදක්වා උඩඟු ලෙස හැසිරෙන ආකාරය දෙස බලා මැසිවිලි නැගීම හැරුණු විට වෙනත් කළ හැකි කිසිවක් ඔවුන්ට නොවීය.[6] බෞද්ධාගම කඩ නොකොට ආරක්ෂා කරන බවට ගිවිසුමේ පස්වන වගන්තියෙන් පොරොන්දු වුව ද ඉංග්‍රීසින් යටතේ බෞද්ධාගම මෙන් ම භික්ෂූන් වහන්සේලා ද ඉතා නොවැදගත් තැනට වැටෙන බව භික්ෂූහු තේරුම් ගත්හ. තව ද උඩරට සමාජය තුළ චිරාත් කාලයක් මුල් බැස ගෙන තිබූ චාරිත්‍ර-වාරිත්‍ර ගැන නොසලකා ඉංග්‍රීසි ක්‍රමයට උඩරට සමාජය පාලනය කිරීමට යාම නිසා ද අවුල් සහගත තත්ත්වයක් ඇති විය.[7] ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිහසුනෙන් නෙරපා දැමීමට එකතු වූ උඩරට රදලවරු, භික්ෂූන් වහන්සේ හා මහජනයා වැඩිකල් යාමට පෙර ගිය නුවණ ඇතුන්ලවාවත් ඇදගත නොහැකි බව වටහා ගත්හ.

මේ පසුබිම තුළ උඩරට රදලයන් ද භික්ෂූන් වහන්සේ ද වැසියන් ද අතරින් කිහිප දෙනෙකු එක් වී ඉංග්‍රීසින් උඩරටින් පන්නා දැමීමට 1816 වර්ෂයේ දී රහස් ප්‍රයත්නයක් ගන්නා ලදමුත් එක්නැලිගොඩ නිලමේ එම වර්ෂයේ ජූලි මස 18 වන දින දී පමණ කළ පාවාදීම හේතුවෙන් මෙම ප්‍රයත්නය ව්‍යර්ථ කිරීමට ඉංග්‍රීසිහු සමත් වූහ.[8] එම අසාර්ථක ප්‍රයත්නයෙන් පසු ව උඩරට ඉංග්‍රීසි පාලනය බිඳ දමා ස්වදේශිකයන්ගේ රජයක් පිහිටුවීමේ අදහසින් ඌව වෙල්ලස්ස කේන්ද්‍ර කරගනිමින් නැවත වරක් අරගලයක් දියත් විය. 1817 වර්ෂයේ ඔක්තෝබර් මස අරඹා, 1818 නොවැම්බර් දක්වා මුළු උඩරට ප්‍රදේශය පුරා ම පාහේ ව්‍යාප්ත වී ගිය එම අරගලය ඉංග්‍රීසි පක්ෂය කැරැල්ලක්[9] ලෙස අර්ථ ගැන්වුව ද එය

---

5 ඉංග්‍රීසින් විසින් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු පන්නා දමා තමා සිහසුනට පත් කරනු ඇතැයි ඇහැලේපොල නිලමේ අපේක්ෂා කළහ; සිල්වා, බ්‍රිතාන්‍යයින් යටතේ පැවති ලංකාව (1795-1833), 178.

6 සිල්වා, බ්‍රිතාන්‍යයින් යටතේ පැවති ලංකාව (1795-1833), 184.

7 ''උඩරට රාජ්‍යයේ බ්‍රිතාන්‍ය පාලනය වනාහි, එකම නගුලකට, මී හරකෙක් හා එළ හරකෙක් යෙදීම වැනි විෂම වූවකැ''යි එක් ගම් පාලකයෙකු කළ ප්‍රකාශයෙන් පැවති අවුල් සහගත තත්ත්වය මනාව පැහැදිලි කරන්නකි.

8 ඉහගම කුමන්ත්‍රණය වශයෙන් ද හැඳින්වෙන බ්‍රිතාන්‍ය විරෝධී මෙම පෙළගැස්ම ඉහගම උන්නාන්සේ සහ මඩුගල්ලේ උඩගබඩා නිලමේගේ මූලිකත්වයෙන් සිදු විය. බුරුම රටින් රාජ කුමාරයෙකු ගෙන්වා ගෙන උඩරට සිහසුනට පත් කිරීම මොවුන්ගේ අභිලාෂය වී පැවතුණි; විමලානන්ද තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (දෙවන කාණ්ඩය), (කොළඹ 11: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 2010), 1-62.

9 1817 නොවැම්බර් මස 07 (අංක 248), නොවැම්බර් 27 (අංක 251), දෙසැම්බර් 15 (අංක 255), දෙසැම්බර් 28 (අංක 258) දාතම සහිත ව රොබට් බ්‍රවුන්රිග් විසින් බැතර්සට් වංශාධිපතිතුමාට යොමු කළ ලිපිවල මෙම නිදහස් සටන බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි කැරැල්ලක් වශයෙන් හඳුන්වා ඇත; තෙන්නකෝන්,

වනාහි ඉංග්‍රීසි පාලනයට එරෙහි ව සිංහලයන් දියත් කළ 'ප්‍රථම නිදහස් සටන'[10] වශයෙන් හැඳින්වීම එම අරගලයට උරදුන් විරෝධාර දේශප්‍රේමීන්ගේ නාමයට ද කෙරෙන මහත් වූ ගෞරවයකි. උඩරට බහුතරයක් රදලවරුන්,[11] බෞද්ධ භික්ෂූන් වහන්සේලා, සාමාන්‍ය ජනතාව සහ වැදි ජනතාව ද 1818 නිදහස් සටනේ කොටස්කරුවෝ වූහ. සටන සඳහා නායකත්වය රදල නායකයින් සහ බෞද්ධ භික්ෂූන් වහන්සේ විසින් ලබා දෙන්නට යෙදුණි. සටනට එක් වූ රදලයෝ දිසාවේ, රටේ අදිකාරම්, මොහොට්ටාල, රටේ රාල, ගමැති රාල, රෙහෙන රාල, විදානේ වැනි විවිධ තරාතිරම්වලට අයත් වූහ.[12] මොවුන්ගේ එක ම අරමුණ වූයේ ඉංග්‍රීසි පාලනය උඩරටින් තුරන් කොට සිංහල බෞද්ධ සංස්කෘතිය ආරක්ෂා කරන පාලකයෙකු උඩරට සිහසුනට පත්කර ගැනීම යි.

සටන මැනවින් සංවිධානය වී නොතිබීම, ඒවා හුදකලා සටන් බවට පත් වීම, රදල නායකයින් අතර පැවති පුද්ගලික අමනාපකම් මේ බැරෑරුම් අවස්ථාවේ දී පවා අත් නොහැරීම, රාජ ප්‍රතිරූපකයාට රාජ්‍ය උරුමයක් නොමැති බව හෙළි වීම සහ ඉංග්‍රීසින් 'මාර්ෂල් ලෝ' හෙවත් යුද්ධ නීතිය පනවා නිදහස් සටන දැඩි ලෙස මර්දනය කිරීම[13] තුළ ඉහත අරමුණ බිඳ වැටිණි.

මෙහි ප්‍රතිඵල විමසන කල, 1818 නිදහස් සටන උඩරට රදල ප්‍රධානීන්ගේ ඉරණම කෙරෙහි බෙහෙවින් බලපෑවේ ය. එහි දී නිදහස් සටනට උරදුන් රදල නායකයින්ට සහ භික්ෂූන් වහන්සේට අත් වූ ඉරණම අංශ කිහිපයක් යටතේ විග්‍රහ කළ හැකි ය. එනම්,

- සටනට සම්බන්ධ නායකයන් කැරලිකරුවන් ලෙස නම් කොට දේපොළ රාජ සන්තක කිරීම.

---

උඩරට මහ කැරැල්ල (දෙවන කාණ්ඩය), 81-117.

10 එහෙත් 1818 සටන් සමයේ මහනුවර ප්‍රධාන වෛද්‍ය නිලධාරියා වශයෙන් සේවය කළ හෙන්රි මාෂල් කිසි ම පැකිලීමකින් තොර ව මෙම අරගලය නිදහස් සටනක් ලෙස හඳුන්වා ඇත; මාලනී ඇඳගම, ''යටත් විජිත වාදය හා ස්වදේශීන්ගේ ප්‍රතික්‍රියා'' ශ්‍රී ලාංකේය ඉතිහාසය, තෙවන වෙළුම, සංස්. ඩබ්.කේ.එම්. විජේතුංග, (කොළඹ 12: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 2012), 130-131.


11 එහෙත් මොල්ලිගොඩ, ඒක්නැලිගොඩ, දිඹුලාන, දෙහිගම, මහවලතැන්නේ වැනි නිලමේවරු කිහිප දෙනෙක් ඉංග්‍රීසි පක්ෂය ගෙන නිදහස් සටන බිඳ හෙළීමට වර්තමානයේ ඇතැම් ජාතිද්‍රෝහීන් සේ කටයුතු කරන ලදි. නිදහස් සටන අවසානයේ 1818 නොවැම්බර් මස 21 වන දින නිකුත් කළ රාජාඥාවේ 22 වන වගන්තියෙන් ඔවුන්ගේ ඉඩම් බද්දෙන් නිදහස් කිරීමට ද කටයුතු කර ඇත; ඩේවි දුටු ලංකාව, පරි. ඇල්ලේපොළ එච්.ඇම්. සෝමරත්න, (බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ, 2013), 444.

12 ජේ.බී. දිසානායක, ''පළමු නිදහස් සටන මෙහෙයවූවෝ කවරහු ද?'', පළමු නිදහස් අරගලයේ ප්‍රත්‍යාවලෝකනය, සංස්. රංග කලන්සූරිය, ප්‍රදීප් එන් වීරසිංහ, (කොළඹ 05: රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව), 14-15.

13 "යම් කිසි පෙදෙසක කැරැල්ල පැන නැඟුණු විට එහි යුද මුරපොළවල් එකක් හෝ කීපයක් හෝ පිහිටුවන ලදි, යුද්ධ නීතිය ප්‍රකාශ කැරිණි, විරෝධය පෑ වැසියන්ගේ ගේදොර ගිනි තබන ලදි, බොහෝ විට ප්‍රයෝජනවත් ගස් කපා හෙළන ලදි, කුඩා බට පිරිස් රට හැම තැන ම සතුරන් සොයමින් ගමන් කළහ. විරෝධය පෑවුන් හා ආයුධ දරා සිටි හැම දෙනම මරා දැමීමට ඔවුන්ට අවසර තිබිණ." වශයෙන් 1818 පළමු නිදහස් සටන ඇසින් දුටු ජොන් ඩේවි සිදුකර ඇති විස්තරයෙන් ඉංග්‍රීසින් සටන් මර්දන කිරීම සඳහා අනුගමනය කළ කුරිරු ප්‍රතිපත්තිය හෙළි වේ; ඩේවි දුටු ලංකාව, පරි. සෝමරත්න, 292.

- බන්ධනාගාර ගත කිරීම.
- මරණීය දණ්ඩනය පැනවීම.
- මුරිසි දිවයිනට පිටුවහල් කිරීම.

මෙම ලිපිය 1818 නිදහස් සටනට සම්බන්ධවීම හේතුවෙන් මුරිසි දිවයිනට[14] (සිතියම් අංක 01) පිටුවහල් කළ කන්ද උඩරට සටන් නායකයන්ගේ ඉරණම පිළිබඳ විවරණයක් සිදුකිරීමේ අභිලාෂයෙන් සම්පාදිතය.




සිතියම් අංක 01 - මුරිසි දිවයිනේ පිහිටීම

## විමර්ශනය

ඉංග්‍රීසින් විසින් නිදහස් සටනේ මුල් පෙළේ නායකයන් මුරිසි දිවයිනට පිටුවහල් කිරීම සිදු කළේ ඔවුන් ලංකාවේ රැඳී සිටීමෙන් ඉංග්‍රීසි පාලනය පවත්වා ගෙන යාමට අනතුරුදායක තත්වයක් නිර්මාණය විය හැකි නිසා බව රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාත්, බැතර්ස්ට් වංශාධිපති අතරත් හුවමාරු වූ ලිපි වලින් හෙළි වේ. 1819 ජනවාරි මස 08 වෙනි දින රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා විසින් බැතර්ස්ට් වංශාධිපතිවරයා වෙත යොමු කළ

[14] මුරිසි දිවයින (වර්තමාන මොරිෂස් සමූහාණ්ඩුව) නිරිත දිග ඉන්දියානු සාගරයේ ඈතින් ද අප්‍රිකා මහද්වීපයට ගිණිකොන දිගින් කිලෝමීටර් 2000ක් පමණ ඈතින් ද වන සේ පිහිටි දූපතකි. දූපතේ දිග කිලෝමීටර් 65ක් ද පළල කිලෝමීටර් 45ක් ද වේ. සමස්ත භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 1864.8කි. පළමු ව මුරිසි දිවයින ඕලන්දයන් විසින් අල්ලා පාලනය කළ අතර (ක්‍රි.ව. 1638 -1710), ඕලන්දය විසින් අතහැර දැමූ පසු ප්‍රංශ ජාතිකයන් එය පාලනය (ක්‍රි.ව. 1710-1810) කළහ. නැපෝලියානු යුද සමයේ දී (ක්‍රි.ව. 1810) බ්‍රිතාන්‍ය පාලනයට මුරිසි දිවයින නතු වූ අතර 1968 දී බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස ලබාගන්නා තෙක් බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වශයෙන් පැවතුණි.

එවැනි ලිපියකින් පිලිමතලව්වේටත් ඉහගම තෙරුන්ටත් නියම කළ දණ්ඩනය (මරණීය දණ්ඩනය) රාජ්‍යාධිකාරී මහෝත්තමයාණන්ගේ නමින් ලිහිල් කොට ජීවිතාන්තය දක්වා දිවයිනෙන් පිටුවහල් කිරීමට නියම කිරීමෙන් ඔවුනට දයාව දක් වූ බව පැවසේ. තව ද එම ලිපියේ,

> *"මේ සුප්‍රකට කැරලි නායකයන් ද එම වරදට අසු වී සිටින තවත් කැරලිකරුවන් දහඅට දෙනෙකු පමණ ද දිවයිනෙහි සිටීම අප මහා රාජෝත්තමයාණන්ගේ ආණ්ඩුවට අහිතකර නිසා ඔවුන් හැකිතාක් ඉක්මනින් පිටුවහල් කරන්නෙමි. සර් රිචර්ඩ් කිං විසින් දෙන ලද පොරොන්දුව අනුව ඔවුහු ලිවර්පූල් නෞකාවෙන් මුරිසි දිවයිනට පිටුවහල් කරනු ලැබෙති. ඔවුන් භාරගෙන හිර අඩස්සියේ තැබීමට නිසි පරිදි කටයුතු කරන බව මේජර් ජෙනරාල් හෝල් (මුරිසි දිවයිනේ අග්‍රාණ්ඩුකාර තැන) විසින් මට දන්වා තිබේ. ඔවුන් පිටුවහල් කොට තැබීමේ කාල සීමාව උඩරට ප්‍රදේශවල අනාගත තත්ත්වය මත රඳා පවතී" යැයි සඳහන් ව ඇත.[15]*

1819 පෙබරවාරි මස 01 වන දින බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා වෙත බැතර්සිට් වංශාධිපති විසින් එවන ලද තවත් ලිපියක,

> *"කැරල්ල ඇති කිරීම සඳහා තම බලය යොදාගත් සියලුම අධිපතීන් උඩරට පළාත්වලින් ඉවත් කොට, ඔවුන්ගේ ද්‍රෝහීකමට පාත්‍ර වූ ප්‍රදේශයට යළිත් පැමිණීම වළක්වනු පිණිස කළ හැකි හැම දෙයක් ම කිරීම යෙහෙකි" සඳහන් කොට තිබේ.[16]*

බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා විසින් නිදහස් සටන් නායකයන් මුරිසි දිවයිනට පිටුවහල් කළේ මෙම පරමාර්ථය ඉටුකර ගැනීමට බව නොරහසකි. ඒ අනුව ඉංග්‍රීසින් විසින් පැවැත් වූ යුද්ධාධිකරණ මගින් මරණ දඬුවම පැණවූ ඇතැම් නායකයන්ගේ එම දඬුවම පසු ව වෙනස් කොට මුරිසි දිවයිනට පිටුවහල් කිරීම සිදු විය.[17] නිදහස් සටනේ නායකයන් විසිහත් දෙනෙකු 1819 වර්ෂයේ පෙබරවාරි මස මුල දී රාජකීය එච්. එම්. එස්. ලිවර්පූල් (**HMS Liverpool**) නෞකාවෙන් මුරිසි දිවයිනට එලෙස පිටුවහල් කිරීමට සැලසුම් කළ බව උඩරට පළාත් භාර ලේකම් ජෝර්ජ් ලුසිග්නන් සකස් කළ ලේඛනයකින් අනාවරණය

15 තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (දෙවන කාණ්ඩය), 257-258.

16 තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (දෙවන කාණ්ඩය), 407.

17 1818 ඔක්තෝම්බර් මස 31 වන දින රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා විසින් බැතර්ස්ට් වංශාධිපති වෙත යොමු කළ ලිපියක (අංක 315) ද මරණ දඬුවම නියම නොකරන උඩරට රදලවරුන් රටින් පිටුවහල් කිරීමේ අභිලාෂය දක්වේ; තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (දෙවන කාණ්ඩය), 246.

වේ.[18] එහෙත් ප්‍රමාද වී 1819 පෙබරවාරි මස 24 දින ගමන් ඇරඹූ ලිවර්පූල් නෞකාවෙන් මුරිසි දිවයිනට පිටුවහල් කළ කන්ද උඩරට සිරකරුවන් සංඛ්‍යාව විසි හතරකි.[19] (01. වගු සටහන)

| | සටන් නායකයාගේ නම | පිටුවහල් කරන ලද කාල සීමාව | තරාතිරම හා චරිතය පිළිබඳ ලුහුඬු විස්තරය |
|---|---|---|---|
| 01 | පිලිමතලාවේ නිලමේ | ජීවිතාන්තය තෙක් | සිංහලේ උසස් ම පෙළපත්වලින් එකකට අයත් මොහු 1803 දීත් ඊට පෙරත් තම ද්‍රෝහී ගතිගුණ මැනවින් පෙන් වූ පළමු අදිකාරම්ගේ පුත්‍රයෙකි. විශේෂ හේතූන් නිසා මොහුගේ ජීවිතය බේරීමට ආණ්ඩුව පෙළඹී ඇත. පළමු පංතියේ ජීවන පහසුකම් ඔහුට ලබාදිය යුතු ව ඇත. |
| 02 | මත්තමගොඩ තුන්කෝරළයේ දිසාව | ජීවිතාන්තය තෙක් | මෙම පුද්ගලයා සිංහලේ උසස් ම පෙළපතකට අයත් නොවූවත් ඉතා වැදගත් දෙවැනි පවුලකට අයත් වූවෙකි. පළමුවන පංතියේ ජීවන පහසුකම් ලබාදිය යුතු යි. |
| 03 | ඊරියගම නිලමේ | ජීවිතාන්තය තෙක් | මොහු තුන්වෙනි තරාතිරමේ පවුලකට අයත් කෙනෙකි. දෙවන පංතියේ ජීවන සැප පහසුකම් ලබාදිය යුතු ය. |
| 04 | තුම්පනේ වලපාගොල්ලේ මුහන්දිරම් | අවුරුදු 5කට | මොහු තුන්වෙනි තරාතිරමේ පවුලකට අයත් කෙනෙකි. දෙවන පංතියේ ජීවන සැප පහසුකම් ලබාදිය යුතු ය. |
| 05 | දුම්බර පිටවල ලේකම් නිලමේ | අවුරුදු 5කට | මොහු තුන්වෙනි තරාතිරමේ පවුලකට අයත් කෙනෙකි. දෙවන පංතියේ ජීවන සැප පහසුකම් ලබාදිය යුතු ය. |
| 06 | වියළුවේ හාපත්ගම මොහොට්ටාල (ජ්‍යෙෂ්ඨ) | ජීවිතාන්තය තෙක් | විශාල බලපැවැත්මක් ඇති මොහු වලපනේ පළමුවෙන් ම කැරැල්ල ආරම්භ කළ දෙදෙනාගෙන් එක් අයෙකි. දෙවන පංතියේ ජීවන සැප පහසුකම් ලබාදිය යුතු ය. |

18 තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (දෙවන කාණ්ඩය), 152-153.

19 ලුසිග්නන්ගේ ලේඛනයේ සඳහන් කනවැරැල්ලේ රටේරාල සහ හත්පෝරුවේ ලියනරාල නෞකාව පිටත් වීම ප්‍රමාද වීම නිසා ලංකාවේ දී ම මිය ගොස් තිබුණි. තව ද එම ලේඛනයේ සඳහන් වූ රාමසාමි නැමැත්තා නෞකාව පිටත් වීමට ප්‍රථම රෝගාතුර වූ හෙයින් එදින මුරිසියට පිටත් කර යවනු නොලැබිය. පසු ව ඔහු ව 1820 පෙබරවාරි මාසයේ දී ඇලෙක්සැන්ඩර් නෞකාවෙන් මුරිසියට පිටත් කර යවා තිබේ; රාජා සී දිසා බණ්ඩාරනායක, දිවයින් අතර (මුරිසියට පිටුවහල් කෙරුණු කන්ද උඩරට සිරකරුවන් පිළිබඳ කතාන්දරය), (කොළඹ 04: විජිත යාපා ප්‍රකාශන, 2010), 90-95.

| | | | |
|---|---|---|---|
| 07 | වියළුවේ හාපත්ගම මොහොට්ටාල (කනිෂ්ඨ) | ජීවිතාන්තය තෙක් | විශාල බලපැවැත්මක් ඇති මොහු වලපනේ පළමුවෙන් ම කැරැල්ල ආරම්භ කළ දෙදෙනාගෙන් එක් අයෙකි. දෙවන පංතියේ ජීවන සැප පහසුකම් ලබාදිය යුතු ය. |
| 08 | තුම්පනේ දේදුනුපිටියේ මොහොට්ටාල | අවුරුදු 7කට | තුන්වෙනි තරාතිරමේ පවුලකට අයත් ය. උදෙහෝගී කැරැලිකරුවෙකි. දෙවන පංතියේ ජීවන පහසුකම් සලසා දිය යුතු ය. |
| 09 | වැත්තැවේ හිටපු රටේ රාල | අවුරුදු 6කට | තුන්වෙනි තරාතිරමේ පවුලකට අයත් ය. උදෙහෝගී කැරැලිකරුවෙකි. දෙවන පංතියේ ජීවන පහසුකම් සලසා දිය යුතු ය. |
| 10 | කැටකුඹුරේ හිටපු රටේ මහත්මයා | අවුරුදු 5කට | තුන්වෙනි තරාතිරමේ පවුලකට අයත් ය. උදෙහෝගී කැරැලිකරුවෙකි. දෙවන පංතියේ ජීවන පහසුකම් සලසා දිය යුතු ය. |
| 11 | ඌවේ වත්තේකැලේ මොහොට්ටාල | අවුරුදු 7කට | තුන්වෙනි තරාතිරමේ පවුලකට අයත් ය. දක්ෂ කැරැලිකරුවෙකි. දෙවන පංතියේ ජීවන පහසුකම් සලසා දිය යුතු ය. |
| 12 | ඌවේ රාහුපොළ පිහනරාල | අවුරුදු 5කට | තුන්වෙනි තරාතිරමේ පවුලකට අයත් ය. දක්ෂ කැරැලිකරුවෙකි. දෙවන පංතියේ ජීවන පහසුකම් සලසා දිය යුතු ය. |
| 13 | ඌවේ මිගහපිටියේ රටේ රාල | ජීවිතාන්තය තෙක් | එස්.ඩී. විල්සන් මහතා මැරීමට සම්බන්ධ යි. තුන්වෙනි තරාතිරමේ පවුලකට අයත් ය. දෙවන පංතියේ ජීවන පහසුකම් සලසා දිය යුතු ය. |
| 14 | සබරගමුවේ දෙමෝදර මොහොට්ටාල | ජීවිතාන්තය තෙක් | සබරගමුවේ විශාල බලපැවැත්මක් සහිත වැදගත් පවුලකට සම්බන්ධ යි. කැරැලිකරුවෙකු වශයෙන් ඉතා උනන්දු විය. දෙවන පංතියේ ජීවන පහසුකම් සලසා දිය යුතු ය. |
| 15 | අඹගස්පිටියේ නිලමේ | ජීවිතාන්තය තෙක් | මොහු ද තුන්වෙනි පැලැන්තියේ පවුලකට අයත් ය. දුම්බර කැරැල්ලේ දී උදෙහෝගී ව ක්‍රියාකළ කැරැලි කරුවෙකි. |
| 16 | ඉහගම උන්නාන්සේ | ජීවිතාන්තය තෙක් | එක් අවධියක දී සිවුරේ සිටි තැනැත්තෙකි. ප්‍රයෝගකාරී කුමන්ත්‍රණකාරයෙකු වන මේ පුද්ගලයා සැලකිය යුතු පරපුරකට අයත් නොවේ. එහෙත් 1816 කුමන්ත්‍රණයට සම්බන්ධ මොහු, කැරැල්ලේ දී ඉතා උනන්දු විය. දෙවන පංතියේ ජීවන පහසුකම් සලසා දිය යුතු ය. |

| | | | |
|---|---|---|---|
| 17 | වෙල්ලස්සේ කොහුකුඹුරේ රටේ රාල | ජීවිතාන්තය තෙක් | මොහු වෙල්ලස්සේ කැරැල්ල ඇති කළ පුද්ගලයන්ගෙන් එක් කෙනෙකි. විශේෂ හේතූන් නිසා ඔහුගේ ජීවිතය බේරන ලදි. දෙවන පංතියේ ජීවන පහසුකම් සලසා දිය යුතු ය. |
| 18 | දන්ගමුවේ මොහොට්ටාල | ජීවිතාන්තය තෙක් | මොහු තුන්වෙනි තරාතිරමේ පවුලකට අයත් ය. එඩිතර කැරැලිකරුවෙකි. දෙවන පංතියේ ජීවන පහසුකම් සලසා දිය යුතු ය. |
| 19 | මීවතුරේ හිටපු ලේකම් | ජීවිතාන්තය තෙක් | මේ පුද්ගලයා සැලකිය යුත්තෙක් නොවේ. සේනාවන්ට අවහිර කිරීමේ දී හා යටිනුවර කැරැල්ලක් ඇති කිරීමේ දී ඉතා උනන්දුවෙන් ක්‍රියා කළ පුද්ගලයෙකි. දෙවන පංතියේ ජීවන පහසුකම් සලසා දිය යුතු ය. |
| 20 | ඌවේ ගොඩේගෙදර අදිකාරම් | ජීවිතාන්තය තෙක් | තුන්වෙනි තරාතිරමේ පවුලකට අයත් ය. මොහු පුදුම අධිෂ්ඨාන වියරුයක් ඇති කැරැලිකරුවෙකි. මොහුට දෙවන පංතියේ ජීවන පහසුකම් සලසා දිය යුතු ය. |
| 21 | ඊරියගම රටේ මහත්මයා | අවුරුදු 7කට | මොහු තුන්වෙනි තරාතිරමේ පවුලකට අයත් ය. යුද්ධ නීතිය යටතේ නඩු නොපවරන ලද නමුදු දූනට නිදැල්ලේ හැසිරීමට යෝග්‍ය නොවන (රටේ සාමයට අන්තරාය දායක) පුද්ගලයෙකි. |
| 22 | තලගුණේ වනක්කු නිලමේ | අවුරුදු 5කට | මොහු තුන්වෙනි තරාතිරමේ පවුලකට අයත් ය. යුද්ධ නීතිය යටතේ නඩු නොපවරන ලද නමුදු දූනට නිදැල්ලේ හැසිරීමට යෝග්‍ය නොවන (රටේ සාමයට අන්තරාය දායක) පුද්ගලයෙකි. |
| 23 | හතර කෝරලයේ කෙම්පිටියේ කෝරාළ | අවුරුදු 7කට | මහත් බලපැවැත්මක් ඇති මොහු කැරැල්ලේ උද්‍යෝගී ආධාර කරුවෙක් විය. තුන්වන පෙළපතකට අයත් ය. දෙවන පන්තියේ ජීවන පහසුකම් සලසා දිය යුතු ය. |
| 24 | කුරුකොහෝගම කිරිබණ්ඩා | ජීවිතාන්තය තෙක් | කුනම් මඩුවේ ලේකම් ලෙස ද හැඳින් වේ. |

01. වගු සටහන - රාජකීය ලිවර්පූල් නෞකාවෙන් 1819 පෙබරවාරි මස 24 දින මුරිසියට පිටුවහල් කළ නිදහස් සටන් නායකයන්

ලිවර්පූල් නෞකාවෙන් මුරිසි දිවයිනට පිටුවහල් කළ මෙම පළමු සිරකරුවන් කණ්ඩායම පිටත් වූයේ කොළඹ වරායෙනි.[20] කපිතාන් කොලියර් නෞකාවේ කපිතාන් වශයෙන් කටයුතු කෙරිණි. පිලිමතලාවේ විසින් එම කණ්ඩායමේ උඩරැටියන්ට නායකත්වය ලබාදෙන ලද අතර, මෙහෙකරුවන් තිදෙනෙකු[21] ද තෝල්කයෙකු ද ඊට අයත් වී ඇත. මහ රජතුමන්ගේ දෙවැනි ලංකා රෙජිමේන්තුවේ ලෙෆ්ටිනන්ට් විලියම් ස්ටුවර්ට් උඩරට සිරකරුවන් කණ්ඩායමේ භාරකරු වශයෙන් කටයුතු කරන ලදි.

රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාගේ අණ පරිදි උඩරට පළාත් පිළිබඳ ලේකම් ජෝර්ජ් ලුසිග්නන් 1819 පෙබරවාරි මස 21 වන දින නිකුත් කළ ලේඛනයකින් සිරකරුවන්ගේ භාරකරු වශයෙන් කටයුතු කළ විලියම් ස්ටුවර්ට්හට නෞකාවේ දී හා මුරිසියේ දී සිරකරුවන් සම්බන්ධයෙන් අනුගමනය කළ උපදෙස් මාලාවක් නිකුත් කොට තිබේ.[22] ඒ මෙසේ ය,

- නෞකාවේ දී කපිතාන් හා නිලධාරීන් ද සිරකරුවන් අතර ද කථාබස් කර ගැනීමේ මැදිහත්කරු වශයෙන් කටයුතු කිරීම.
- මුරිසියේ ප්‍රධාන ලේකම් හමු වී සිරකරුවන්ගේ තරාතිරම, පුරුදු හා ඕනෑකම් ආදි කරුණු අවශ්‍ය පරිදි තේරුම් කර දීම.
- සිරකරුවන් සිරකර තැබීම සඳහා තැනක් හෝ තැන් කීපයක් වෙන්කර දුන් විට සිරකරුවන් ඒ ස්ථාන සඳහා ගෙනයාමට කටයුතු කිරීම.
- ඒ ස්ථාන සිරකරුවන්ගේ ආරක්ෂාවට සුදුසුදැයි අනලස් ව පරීක්ෂා කර බලා නිවැරදි විය යුතු යම් වරදක් තිබේ නම් ඒ බව රජයට (මුරිසියේ) ගෞරව සම්පන්නව දැන්වීම.
- සිරකරුවන්ට මුරිසියේ දී ආහාර දීමේ දී[23] හැකිතාක් ලංකාවේ දී ඔවුන්ට හුරු පරිදි ම ලබාදීමට සුදුසු ලෙස කටයුතු කිරීම.
- එහි දී සපයා ගත නොහැකි ද්‍රව්‍ය වෙනුවට යෙදිය හැකි ද්‍රව්‍ය (විකල්ප ද්‍රව්‍යයන්) නිශ්චය කිරීමට සහාය ලබා දීම.

---

20 බණ්ඩාරනායක, දිවයින් අතර (මුරිසියට පිටුවහල් කෙරුණු කන්ද උඩරට සිරකරුවන් පිළිබඳ කතාන්දරය), 90.

21 එම මෙහෙකරුවන් තිදෙනාගෙන් දෙදෙනෙක් පිලිමතලාවේ සහ මත්තමගොඩට අයත් වූ අතර අනෙක් මෙහෙකරු අයත් වූයේ තෝල්කයා වශයෙන් කටයුතු කළ දොන් ඩැනියෙල්ට ය; බණ්ඩාරනායක, දිවයින් අතර (මුරිසියට පිටුවහල් කෙරුණු කන්ද උඩරට සිරකරුවන් පිළිබඳ කතාන්දරය), 89.

22 තෙන්නකෝන් උඩරට මහ කැරැල්ල (දෙවන කාණ්ඩය), 337-338.

23 මුරිසි දිවයිනට පිටුවහල් කළ කන්ද උඩරට සිරකරුවන්ට ලිවර්පූල් නෞකාවේ දී මෙන් ම මුරිසි දිවයිනේ දී ද ආහාර ලබා දීමේ දී පන්ති දෙකකට බෙදා කටයුතු කොට ඇත. පිලිමතලාවේ සහ මත්තමගොඩ පළමු පන්තියටත් සෙසු අය දෙවන පන්තියටත් අයත් වූ බව පෙනේ; තෙන්නකෝන් උඩරට මහ කැරැල්ල (දෙවන කාණ්ඩය), 340.

- සිරකරුවන්ට බුලත් සැපයීම[24] සම්බන්ධයෙන් කුමක් කළ යුතුදැයි වැඩි කල් යන්නට පෙර වාර්තාවක් එවීම.
- මුරිසියේ දී දිනපතා සිරකරුවන් බැලීමට යාම.
- ආණ්ඩුකාරතුමා (ලංකාවේ) වෙත ඉදිරිපත් කිරීම සඳහා සිරකරුවන් පිළිබඳ මාසික වාර්තාවක් උඩරට පළාත් ලේකම් වෙත එවිය යුතු ය. (එහි එක් එක් සිරකරුවාගේ සෞඛ්‍ය හා හැසිරීම පිළිබඳ ව වෙන් වෙන් වශයෙන් කරුණු සඳහන් විය යුතු වේ.)
- සිරකරුවන්ගේ වියදම් පිළිබඳ වාර්තා තබා ගැනීම.
- මුරිසි රජය සමග ගනුදෙනු කර ගන්නා ලියුම්වල පිටපත් තබාගෙන මාස්පතා ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කිරීමට උඩරට පළාත් ලේකම් වෙත එවිය යුතු ය.
- සිරකරුවන් මුරිසියේ සිට ලංකා ආණ්ඩුවට හෝ තම ඥාතීන්ට හෝ යම්කිසි ලිපි ලේඛනාදියක් එවීමට කැමති නම් ඒ සියල්ල සහතික ලෙස ම භාරගෙන සුදුස්සක් කිරීම පිණිස උඩරට පළාත් ලේකම් වෙත එවිය යුතු ය.
- පිටුවහල් කළ සිරකරුවන්ගේ වැදගත්කම මනා ලෙස වටහාගෙන ඔවුන් ගැලවී යළි ලංකාවට පැමිණීම වළක්වා ගැනීම සඳහා ගත හැකි හැම විධි විධානයක් ම යෙදීම.

1819 පෙබරවාරි මස 22 වැනි දින රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා විසින් මුරිසියේ අග්‍රාණ්ඩුකාර මේජර් ජෙනරාල් හෝල් මහතා[25] වෙත යොමු කළ ලිපියකින් මුරිසි දිවයිනට පිටුවහල් කළ කන්ද උඩරට පළමු සිරකරුවන් කණ්ඩායමේ භාරකරු වශයෙන් පත් කරන ලද ලෙෆ්ටිනන් විලියම් ස්ටුවර්ට්[26] ඒ සඳහා තෝරා ගැනීමට ඉවහල් වූ කරුණු අනාවරණය වේ.

> *''ඔහුට සිංහල භාෂාව කථා කරන්නටත් ලියන්නටත් පුළුවන, එසේ ම ඔහු උඩරටියන්ගේ ගති සිරිත් හා චරිත ස්වභාව දනී.''*[27]

කන්ද උඩරට පළමු සිරකරුවන් කණ්ඩායම රැගත් ලිවර්පූල් නෞකාව මුරිසි දිවයින බලා යාත්‍රා කිරීමේ දී ඔවුන්ට අවශ්‍ය විවිධ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ද රැගෙන ගොස් තිබේ. ඒ අනුව කන්ද උඩරට සිරකරුවන්ට දින 45කට සෑහෙන ආහාර පාන, මාස තුනකට සෑහෙන

---

24 උඩරට සිරකරුවන්ට අවශ්‍ය බුලත් සපයා දී ම කෙරෙහි ලංකා ආණ්ඩුව කෙතරම් සැලකිලිමත් වූයේ ද යත්, මුරිසියේ අග්‍රාණ්ඩුකාර හෝල් මහතාගෙන් සිරකරුවන්ගේ ප්‍රයෝජනයට ගැනීම සඳහා බුලත් පැළ කිහිපයක් බෝ කරන ලෙස යෝජනා කොට තිබේ; තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (දෙවන කාණ්ඩය), 340-341.

25 එහෙත් මෙම ලිපිය ලැබෙන විට මුරිසි දිවයිනේ ආණ්ඩුකාරයා ලෙස කටයුතු කළේ මේජර් ජෙනරාල් රැල්ෆ් ඩාලින් ය.

26 ලෙෆ්ටිනන් විලියම් ස්ටුවර්ට් ඉටු කළ මෙම රාජකාරී කටයුතු සඳහා දිනකට සිලිම් 5යි පැන්ස 3ක් වූ රෙජමේන්තු පඩිය ද, පළමුවෙනි ලෙෆ්ටිනන්ට් කෙනෙකුට නියමිත අතිරේක දිවයින් දීමනාව හා සිරකරුවන් භාරව සිටීම සඳහා දිනකට සිලිම් 10 බැගින් අතිරේක දීමනාවක් ද හිමි වී තිබේ; තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (දෙවන කාණ්ඩය), 340-341.

27 තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (දෙවන කාණ්ඩය), 340-341.

පුවක් සහ දුම්කොළ, අවුරුද්දකට සරිලන රෙදි තොගයක්, තේ, කෝපි, සීනි හා මද්‍යසාර කුඩා තොගයක් ද නැවට පටවා තිබේ.[28] උඩරට සිරකරුවන් කණ්ඩායම මුරිසි දිවයිනට ළඟා වූ නිශ්චිත දිනය වාර්තා වී නැතත් ආසන්න වශයෙන් මෙම ගමනට සති තුනක් ගත වන්නට ඇතැයි අනුමාන කළ හොත් පළමු කන්ද උඩරැටියන් කණ්ඩායම 1819 මාර්තු මැද භාගයේ මුරිසි දිවයින මත පා තබන්නට බොහෝ දුරට ඉඩ තිබේ.[29] මෙලෙස මුරිසි දිවයිනට පිටුවහල් කළ පළමු වන කන්ද උඩරට සිරකරුවන් කණ්ඩායමේ ඇතැම් සිරකරුවන් එහි දී මරණයට පත් වූ අතර (වගු සටහන 02), තවත් සිරකරුවන් පිරිසක් සිය දඬුවම් කාලය නිමාවීමෙන් පසු හෝ විශේෂ හේතු මත නිදහස ලබා පෙරළා ලංකාවට පැමිණ තිබේ (වගු සටහන 03).

| | සිරකරුවාගේ නම | මරණයට පත් වූ දිනය |
|---|---|---|
| 01 | තලගුණේ වනක්කු නිලමෙ | 1819 දෙසැම්බර් මස 20 දින කොලරාව රෝගය නිසා මරණයට පත් විය. |
| 02 | කුරුකොහෝගම කිරිබණ්ඩා | 1820 ජූලි මස 11 දින පාචනය රෝගය නිසා මරණයට පත් විය. |
| 03 | මීවතුරේ හිටපු ලේකම් | 1821 නොවැම්බර් මස 08 දින මරණයට පත් විය. |
| 04 | දේදුනුපිටියේ මොහොට්ටාල | 1822 සැප්තැම්බර් මස 28 දින වියපත් වීමෙන් මරණයට පත් විය. |
| 05 | හාපත්ගම මොහොට්ටාල (කනිෂ්ඨ) | 1822 දෙසැම්බර් මස 22 දින පාචනය රෝගය නිසා මරණයට පත් විය. |
| 06 | දන්ගමුවේ මොහොට්ටාල | 1823 සැප්තැම්බර් මස 17 දින පාචනය රෝගය නිසා මරණයට පත් විය. |
| 07 | ඊරියගම නිලමේ | 1825 මැයි මස 18 දින පෙනහලු ඉදිමීමේ රෝගය නිසා මරණයට පත් විය. |
| 08 | කොහුකුඹුරේ රටේ රාල | 1825 ජූනි මස 20 දින මරණයට පත් විය. |
| 09 | මත්තමගොඩ තුන්කෝරළයේ දිසාව | 1825 ජූනි මස 27 දින වාතාබාධයකින් මරණයට පත් විය. |
| 10 | හාපත්ගම මොහොට්ටාල (ජ්‍යෙෂ්ඨ) | 1826 ජනවාරි මස 19 දින බීමත්කමට ඇබ්බැහිවීම නිසා මරණයට පත් විය. |
| 11 | අඹගස්පිටියේ නිලමේ | 1831 නොවැම්බර් 06 දින මරණයට පත් විය. |
| 12 | මීගහපිටියේ රටේ රාල | කලක් රෝගී ව සිට 1831 නොවැම්බර් මස 06 දින මරණයට පත් විය. |

වගු අංක 02 - මුරිසි දිවයිනේ දී මරණයට පත් වූ උඩරට සිරකරුවන් (ලිවර්පූල් නෞකාවෙන් පිටුවහල් කළ පළමුවන සිරකරු කණ්ඩායමට අයත්)

[28] තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (දෙවන කාණ්ඩය), 338-339.

[29] බණ්ඩාරනායක, දිවයින් අතර (මුරිසියට පිටුවහල් කෙරුණු කන්ද උඩරට සිරකරුවන් පිළිබඳ කතාන්දරය), 32.

| | සිරකරුවාගේ නම | පිටුවහල් කරන ලද කාල සීමාව | නිදහස ලබා ලංකාට පැමිණි වර්ෂය | ලංකාවට පැමිණි නෞකාව |
|---|---|---|---|---|
| 01 | කෙම්පිටියේ කෝරාළ | අවුරුදු 7කට | 1824 නොවැම්බර් 16 දින | සිමන්ඩ්‍රා නෞකාව |
| 02 | දෙමෝදර මොහොට්ටාල | ජීවිතාන්තය තෙක් | 1824 නොවැම්බර් 16 දින | සිමන්ඩ්‍රා නෞකාව |
| 03 | රාහුපොළ පිහනරාල | අවුරුදු 5කට | 1824 නොවැම්බර් 16 දින | සිමන්ඩ්‍රා නෞකාව |
| 04 | වැත්තැවේ හිටපු රටේ රාල | අවුරුදු 6කට | 1824 නොවැම්බර් 16 දින | සිමන්ඩ්‍රා නෞකාව |
| 05 | වත්තේකැලේ මොහොට්ටාල | අවුරුදු 7කට | 1824 නොවැම්බර් 16 දින | සිමන්ඩ්‍රා නෞකාව |
| 06 | ඊරියගම රටේ මහත්මයා | අවුරුදු 7කට | 1825 අගෝස්තු 05 දින | බ්‍රිග්මාරියා නෞකාව |
| 07 | කැටකුඹුරේ හිටපු රටේ මහත්මයා | අවුරුදු 5කට | 1825 අගෝස්තු 05 දින | බ්‍රිග්මාරියා නෞකාව |
| 08 | වලපාගොල්ලේ මුහන්දිරම් | අවුරුදු 5කට | 1825 අගෝස්තු 05 දින | බ්‍රිග්මාරියා නෞකාව |
| 09 | පිටවල ලේකම් නිලමෙ | අවුරුදු 5කට | 1825 අගෝස්තු 05 දින | බ්‍රිග්මාරියා නෞකාව |
| 10 | ගොඩේගෙදර අදිකාරම් | ජීවිතාන්තය තෙක් | 1832 ජූලි 27 දින | හෙක්ටර් නෞකාව |
| 11 | ඉහගම උන්නාන්සේ | ජීවිතාන්තය තෙක් | 1832 ජූලි 27 දින | හෙක්ටර් නෞකාව |
| 12 | පිලිමතලාවේ නිලමේ[1] | ජීවිතාන්තය තෙක් | 1832 සැප්තැම්බර් 16 දින | ඇට්වික් නෞකාව |

වගු අංක 03 - නිදහස ලබා ආපසු ලංකාවට පැමිණි උඩරට සිරකරුවන් (ලිවර්පූල් නෞකාවෙන් පිටුවහල් කළ පළමු සිරකරු කණ්ඩායමට අයත්)

1818 නිදහස් සටන අවස්ථාවේ දී බලහත්කාරයෙන් මහනුවරින් පිටමන් කරනු ලැබ කොළඹ කොටුවේ නිවාස අඩස්සියේ වසර හතක් කිසිදු චෝදනාවක් නොමැති ව සිරකර තැබූ ඇහැලේපොල මහ නිලමේ ද 1825 මැයි මස 14 දින ඇලෙක්සැන්ඩර් නෞකාවෙන් මුරිසි දිවයිනට පිටුවහල් කිරීම දෛවෝපගත සිදුවීමකි. මෙහෙකරුවන් තිදෙනෙක් ද තෝල්කයෙක් ද ඔහු සඳහා රැගෙන ගියත්, මෙහෙකරුවන් අතරින් එක් අයෙක් ද තෝල්කයා ද ඔහුගේ මෙහෙකරු ද ඔවුන්ගේ ඉල්ලීම පරිදි මාස දෙකකට පසු පෙරළා ලංකාවට පැමිණ ඇත.[30] පෝට් ලුවීහි සිට සැතපුම් හතක් ද පවුඩර් මිල්ස් පරිශ්‍රයේ සිට සැතපුම් එකහමාරක් දුරින් පිහිටි පැම්ප්පමූස් ගම්මානය මුරිසියේ දී ඇහැලේපොල නිලමේගේ ස්ථිර වාසස්ථානය විය.[31] වසර හතරක් මුරිසියේ දිවිගෙවූ ඔහු ද 1829 අප්‍රේල් මස 05 වන දින මරණයට පත් විය.[32] තම මළ සිරුර ආදාහනය කරන ලද ස්ථානයේ තම පෞද්ගලික අරමුදල්වලින් වියදම් දරා සොහොනක් ඉදි කරනු ඇතැයි ඇහැලේපොල නිලමේ අපේක්ෂා කර තිබුණි.[33]



01. ඡායාරූපය - කන්ද උඩරට සිරකරුවන් මුරිසි දිවයිනේ නේවාසික ව සිටි ගොඩනැගිල්ල
(වර්තමාන තත්ත්වය)

30 බණ්ඩාරනායක, දිවයින් අතර (මුරිසියට පිටුවහල් කෙරුණු කන්ද උඩරට සිරකරුවන් පිළිබඳ කතාන්දරය), 178.

31 බණ්ඩාරනායක, දිවයින් අතර (මුරිසියට පිටුවහල් කෙරුණු කන්ද උඩරට සිරකරුවන් පිළිබඳ කතාන්දරය), 181-190.

32 බණ්ඩාරනායක, දිවයින් අතර (මුරිසියට පිටුවහල් කෙරුණු කන්ද උඩරට සිරකරුවන් පිළිබඳ කතාන්දරය), 267-295.

33 මෙම සොහොන ගොඩනැගීමට අවශ්‍ය අරමුදල් ද ඇහැලේපොල මහ නිලමේ විසින් සපයා තිබුණි. ඔහු මිය යන මොහොත වන විට ඔහු සතු ව පවුම් 334, ෂිලිං 4, පැන්ස 3 1/2 මුදලක් වූ බව සඳහන් වේ. බණ්ඩාරනායක, දිවයින් අතර (මුරිසියට පිටුවහල් කෙරුණු කන්ද උඩරට සිරකරුවන් පිළිබඳ කතාන්දරය), 287.




## සමෝධානය

1818 දී සිංහලයේ නිදහස වෙනුවෙන් සටන් කළ නායකයන්ට අත් වූ ඉරණම පිළිබඳ විමසා බැලීමේ දී ඇතැම් නායකයන් සටන් අතරතුර දී මරණයට පත් වූ අතර, තවත් පිරිසක් ඉංග්‍රීසින්ගේ අත්අඩංගුවට පත් ව බන්ධනාගාරගත ව සිර දඬුවම් විඳීහ. අත්අඩංගුවට ගත් ඇතැම් අය මරණීය දණ්ඩනයට ලක් කිරීම හෝ රටින් පිටුවහල් කිරීම හෝ සිදු විය. අවස්ථා කිහිපයක දී 1818 ඌව වෙල්ලස්ස නිදහස් සටනට සම්බන්ධ වූ සිරකරුවන් මුරිසි දිවයිනට පිටුවහල් කිරීම සිදු විය. එහි පළමු කණ්ඩායම වූ උඩරැටියන් විසි හතර දෙනෙකුගෙන් සමන්විත පිරිස 1819 පෙරවාරි 24 දින ලංකාවෙන් පිටත් විය. අනතුරු රාමසාමි 1820 වර්ෂයේ ද ඇහැලේපොල නිලමේ 1825 වර්ෂයේ ද මුරිසියට පිටුවහල් කර ඇත. මෙලෙස පිටුවහල් කළ ඇතැම් උඩරැටියන් මුරිසියේ දී මිය ගිය අතර, ඉතිරි වී සිට අය 1832 වන විට නිදහස ලබා නැවත ලංකාවට පැමිණ ඇත. 1818 නිදහස් සටනට හා සම්බන්ධ වූ මුරිසි දිවයිනට පිටුවහල් කළ උඩරැටියන් මුරිසි දිවයිනේ ගත කළ ජීවිතය සම්බන්ධයෙන් විමසා බැලීමේ දී පැහැදිලි වන්නේ ඔවුන් සිරකරුවන් වුව ද ඉංග්‍රීසින් මානුෂීය යුක්ති ධර්මයන්ට අනුකූල ව සැලකීමට උත්සහ කොට ඇති බව යි.

(Footnotes)

1 එහෙත් පිලිමතලාවේ නිදහස් වී පැමිණීමට මාස හයකට පෙර එනම්, 1832 මාර්තු 06 දින එවකට ලංකාවේ ආණ්ඩුකාරවරයා වූ ආර් ඩබ් හෝර්ටන් විසින් ගොඩ්රිච් වංශාධිපතිතුමා වෙත යොමු කළ ලිපියකින් ''පිලිමතලාවගේ දක්ෂකම හා මිනිසුන් ඇද ගැනීමට ඔහු තුළ ඇති ශක්තිය නිසා ඔහුගේ පැමිණීම අනතුරු සහිත ය. පොලිසියේ නියුණු පරීක්ෂණය යටතේ ඔහුට එහිම වාසය කිරීමට අවසර දෙන ලෙස මුරිසියේ ආණ්ඩුවෙන් ඉල්ලා ඇත'' යනුවෙන් ඔහු නිදහස් වී පැමිණීම පිළිබඳ ලංකා ආණ්ඩුවේ අප්‍රසාදය හෙළි වේ; තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (තෙවන කාණ්ඩය), 32.